සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

**මධ්‍ය වාර පරීක්ෂණය 2015**

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - I

**11 ශ්‍රේණිය** **කාලය පැය 01 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 - 40 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 ''ව්‍යවසායකත්වය'' යන්න වඩාත් හොඳින් පැහැදිළි කෙරෙන ප්‍රකාශය වන්නේ,
(1) නිෂ්පාදන සාධක නිෂ්පාදන ක්‍රියාවලියට යොමුකිරීමේ හැකියාවයි.
(2) ව්‍යාපාර අවදානම් භාරගැනීමට ඇති හැකියාවයි.
(3) නව්‍යතා සම්පාදනය කර නව ව්‍යාපාර ආරම්භ කිරීමේ හැකියාවයි.
(4) සම්පත් ලබාගැනීම හා කළමනාකරණය කිරීමේ හැකියාවයි.

02 ''සංවර්ධනය වන ආර්ථිකයක ව්‍යවසායකත්වය මගින් ඉටුවන්නේ විශාල මෙහෙවරකි.'' මෙහිදී ඉහත ඇති ප්‍රකාශයට නොගැලපෙන ප්‍රකාශය වන්නේ,
(1) නව්‍යතා බිහිකරයි. (2) නව ව්‍යාපාර අරඹයි.
(3) අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙයි. (4) නාගරීකරණය වැඩිකරයි.

03 ව්‍යවසායකත්ව ගුණාංගයක් ලෙස පරිකල්පනික චින්තනය පැවතිය යුතු බව සැලකේ. පරිකල්පනික චින්තනය යනුවෙන් අදහස් කරනුයේ,
(1) ව්‍යාපාරික පරිසරය වෙනස් වන සුළුය. මෙම වෙනස්වීම්වලට අනුව තම අභිලාසයන් ද වෙනස් කළ යුතු බවය.
(2) දෙයක මුල දුටු විට අවසානය ගැන සිතා ගැනීමට ඇති හැකියාවත්, එක් දෙයකින් තවත් දෙයක් නිර්මාණය කිරීමට ඇති හැකියාවත්ය.
(3) හොඳ ඇරඹුමක් මගින් හොඳ නිමාවක් හිමිවේ. එනම් යම් ක්‍රියාවක් ආරම්භ කිරීමට හොඳ හැකියාවක් තිබීමයි.
(4) සම්පත් නියම ආකාරයට හසුරුවමින් තමාගේ ක්‍රියාකාරීත්වය පිළිබඳ අන් අයට පැහැදිලි කිරීමේ බලයයි.

04 වර්ෂයේ අයවැය යටතේ ව්‍යාපාරික බදු ප්‍රතිශතය ඉහළ දැමීමට කටයුතු කර ඇත. මෙසේ ව්‍යවසායකත්ව සංවර්ධනය වීම කෙරෙහි ඇති අභියෝග කුමන කරුණක් යටතේ දැක්විය හැකිද?
(1) මනෝවිභීතිය (2) සංස්කෘතිය (3) පරිසරය (4) ආගම

05 ව්‍යවසායකත්වය සංවර්ධනය වීම කෙරෙහි ඇතිකරන අභියෝග වලින් ජය ගැනීමට ගොඩනගා ගතයුතු දෑ පමණක් ඇතුළත් වන්නේ,
(1) දැඩි අධිෂ්ඨානය, කැපවීම, නම්‍යශීලීබව, උනන්දුව, උපායශීලී බව
(2) දැඩි අධිෂ්ඨානය, කැපවීම, සමාජයීය ප්‍රගතිය, උපායශීලී බව
(3) දැඩි අධිෂ්ඨානය, කැපවීම, නම්‍යශීලී බව, ආර්ථික වර්ධනය
(4) දැඩි අධිෂ්ඨානය, සමාජයීය ප්‍රගතිය, ආර්ථික වර්ධනය, නම්‍යශීලී බව

06 සමාජයීය ව්‍යවසායකත්වය මගින් සමාජයට සහ ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභයක් විය නොහැක්කේ,
(1) සමාජයීය පුද්ගල සුභසාධනය.
(2) සමාජයීය හා සංස්කෘතික සාරධර්ම පෝෂණය වීම.
(3) රජයට සුභසාධනය වෙනුවෙන් දැරීමට සිදුවන වියදම වැඩි වීම.
(4) මානව ප්‍රාග්ධනයේ ගුණාත්මක බව වැඩි වීම.

07 කුඩා ව්‍යාපාර හඳුනාගැනීමට ඇති ප්‍රමාණාත්මක නිර්ණායක පමණක් ඇතුළත් වනුයේ,
(1) සේවක සංඛ්‍යාව, නිෂ්පාදන ධාරිතාව, වෙළඳපොල, වාර්ෂික පිරිවැටුම
(2) ආයෝජිත ප්‍රාග්ධනය, භාවිතයට ගන්නා බලශක්ති ප්‍රමාණය, නිෂ්පාදන ධාරිතාව, සේවක සංඛ්‍යාව
(3) නිෂ්පාදන ධාරිතාව, වාර්ෂික පිරිවැටුම වෙළඳපොල, භාවිතා කරන තාක්ෂණය
(4) සේවක සංඛ්‍යාව, ආයෝජිත ප්‍රාග්ධනය, ව්‍යාපාරයේ ස්වභාවය, වෙළඳපොල

08 කාන්තා ව්‍යවසායකත්ව සංවර්ධනයට බලපාන අභියෝගයන් අතරට අයත් නොවන්නේ,
(1) පුරුෂ ආධිපත්‍යය
(2) අවදානම් භාරගැනීමට මැලිවීම
(3) ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන් අඩුකම
(4) සාම්ප්‍රදායික බවින් මැදීමට කැමැති වීම

09 ව්‍යාපාර ආරම්භ වීමට බලපෑ මූලිකම සාධකය වනුයේ,
(1) භාණ්ඩ හා සේවාය (2) අවශ්‍යතා හා වුවමනාය
(3) ආදායම් හා වියදම්ය (4) ලාභ හා පාඩුය

10 ව්‍යවසායකයකුගේ ප්‍රධානතම කාර්යය විය යුත්තේ,
(1) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධක සංයෝග කිරීමයි.
(2) ව්‍යාපාර කළමනාකරණ කටයුතුවලට සහභාගි වීමයි.
(3) මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා නව්‍යතා සම්පාදනයයි.
(4) ආයෝජන ක්‍රියාවලියට දායක වීමයි.

11 ව්‍යවසායකයකු වීමට තීරණය කරන හේතු අතර ''පැවති තත්ත්වයන් වෙනස්වීම මත'' ඇතිවන කරුණක් වන්නේ,
(1) සංස්කෘතිය (2) රජයේ ප්‍රතිපත්ති
(3) ප්‍රමාණවත් යටිතල පහසුකම් (4) වර්තමාන රැකියාව කෙරෙහි කළකිරීම

12 ව්‍යාපාරයන්හී ව්‍යවසායකත්වයේ යෙදීමෙන් වන පිරිවැය අතරට අයත් වන්නේ,
(1) නිදහස හා ස්වාධීන බව (2) සීමිත වූ සමාජ ජීවිතය
(3) ස්වයං සම්පූර්ණ බව (4) ආර්ථිකමය වටිනාකමක් ඇති භාණ්ඩ

13 වැටුප් ලබන රැකියාවක් සම්බන්ධව පැවතිය හැකි අභියෝගයක් නොවන්නේ,
(1) සීමා සහිත වගකීම් (2) ස්ථිර ආදායම
(3) වැඩ කිරීමට ස්ථිර කාලවේලාවක් (4) අදහස් ක්‍රියාත්මක කිරීමට ඇසීරු වීම

14 ව්‍යාපාරිකයනට විවිධ භූමිකා යටතේ ඉටුකරන කාර්යයක් වනුයේ,
(1) සම්පත් සැපයීම (2) සැලසුම් කිරීම
(3) මෙහෙයවීම (4) සම්බන්ධීකරණය

15 මිනිස්සු අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගයෙන් ජීවත් වීමට ලාභය අරමුණු කර නොගෙන පවත්වාගෙන යන සංවිධාන අතර වෙනස් සංවිධානය වනුයේ,
(1) මරණාධාර සමිති (2) සුභසාධක සමිති
(3) අන්‍යෝන්‍යාධාර සමිති (4) සමුපකාර සමිති

16 ක්ෂුද්‍ර ව්‍යාපාර සම්බන්ධයෙන් නොකියවෙන පිළිතුර වනුයේ,
(1) ආදායම ව්‍යාපාරයෙහි නියැලෙන්නාගේ යැපීම සඳහා ප්‍රමාණවත් වේ.
(2) පවුලේ සාමාජිකයන්ගේ සහයෝගය ලබමින් කටයුතු කරයි.
(3) රැකියා අවස්ථා බිහිකිරීමට දක්වන බලපෑම ඉතා වැඩිය.
(4) ගෘහ ආශ්‍රිතව කෙරෙන ඉතා කුඩා ස්වයං රැකියා ව්‍යාපාර වේ.

17 ව්‍යාපාරිකයන් අභිප්‍රේරණය කෙරෙන සාධකයක් ලෙස සැලකිය හැක්කේ,
(1) සමාජ සේවා කටයුතුවලට දායකවීමේ අවශ්‍යතාව
(2) තමා ප්‍රිය කරන පුද්ගලයකු අනුකරණය කිරීමේ අවශ්‍යතාව
(3) තමා තමාගේ ප්‍රධානියා වීමේ අවශ්‍යතාව
(4) අනාරක්ෂිත වැඩ තත්ත්වයන්ගෙන් වෙන්වීමේ අවශ්‍යතාව

18 ව්‍යාපාරික ලෝකය අභියෝගවලින් මෙන්ම ගැටලු වලින් ද ගහණ වූවකි. ඒ අනුව ව්‍යාපාරයට පරිබාහිරව ඇතිවිය හැකි ගැටලුවක් වනුයේ,
(1) පුහුණු සේවක හිඟකම (2) බණිජ තෙල් මිල ඉහළ යාම
(3) සේවක වර්ජන (4) අවශ්‍ය මුදල් හිඟකම

19 ප්‍රධාන පාරට පදිකයින්ට මාරුවීමට යොදාඇති ''කහ ඉර'' වර්ග කළ හැක්කේ,
(1) විද්‍යුත් ලිඛිත සන්නිවේදන ක්‍රමයක් ලෙස
(2) විද්‍යුත් නොවන ලිඛිත සන්නිවේදන ක්‍රමයක් ලෙස
(3) විද්‍යුත් සංඥා සලකුණු ලෙසටය
(4) විද්‍යුත් නොවන සංඥා සලකුණු ක්‍රමයක් ලෙසය

20 කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමයක තිබිය යුතු ගුණාංග දෙකක් වනුයේ,

(1) නිවැරදි බව, මාධ්‍ය (2) නිවැරදි බව, අඩු පිරිවැය

(3) මාධ්‍ය, ලබන්නා (4) ප්‍රතිචාරය, රහස්‍යභාවය

21 ව්‍යාපාර සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ විවිධ ආයතන විසින් සපයනු ලබන මූල්‍ය නොවන පහසුකම් යටතේ උපදේශන පහසුකමක් වනුයේ,

(1) කළමනාකරණ උපදෙස් සැපයීම.

(2) ප්‍රචාරණ උපදෙස් සැපයීම.

(3) ව්‍යාපාර කටයුතු සඳහා අවශ්‍ය දැනුම හා උපදෙස් සැපයීම.

(4) විකුණුම් ප්‍රවර්ධන උපදෙස් සැපයීම.

22 මානව සම්පත පිළිබඳ අධ්‍යයනයේ දී සැලකිල්ලට ගතහැකි සමාජ විද්‍යාත්මක සාධකයක් වනුයේ,

(1) පෞද්ගලිකත්වය (2) පරිභෝජන රටාව (3) අධ්‍යාපන මට්ටම (4) හ ු ර ැ පුරුදුකම්

23 බැංකු අයිරා පහසුකමක් ලබාගැනීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතාව වන්නේ,

(1) ඉතිරිකිරීමේ ගිණුමක් පවත්වාගෙන යෑමය.

(2) ජංගම ගිණුමක් පවත්වාගෙන යෑමය.

(3) ස්ථාවර තැන්පතුවක් පවත්වාගෙන යෑමය.

(4) ස්ථාවර තැන්පතු ගිණුමක රු. 1000/- ක අවම ශේෂයක් පවත්වාගෙන යෑමය.

24 අවසාන වාරිකය ගෙවා නිමවනතෙක් භාණ්ඩයේ නීත්‍යානුකූල අයිතිය විකුණුම්කරු සතුවන ක්‍රමය වන්නේ,

(1) මූල්‍ය කල්බදුවල දී ය. (2) මෙහෙයුම් කල්බදුවල දී ය.

(3) කුලී පිට ගැණුම් ක්‍රමයේ දී ය. (4) විලම්බිත ගෙවුම් ක්‍රමයේ දී ය.

25 ව්‍යාපාර පරිසරය පිළිබඳ සැලකීමේ දී ප්‍රජා පරිසර සාධකයක් නොවන්නේ කුමක් ද?

(1) ප්‍රාදේශීය ව්‍යාප්තිය (2) විදේශ විනිමය අනුපාතිකය

(3) වයස් ව්‍යුහය (4) ජන සංයුතිය

26 පාරිභෝගිකයාගේ මිලට ගැනීමේ ක්‍රියාවලිය අනුපිළිවෙලින් දැක්වෙනුයේ,

(1) මිලට ගැනීම, තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, වුවමනා හඳුනා ගැනීම

(2) තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, වුවමනා හඳුනා ගැනීම, මිලට ගැනීම

(3) වුවමනා, හඳුනා ගැනීම, තොරතුරු ඇගයීම, තොරතුරු සෙවීම, මිලට ගැනීම

(4) වුවමනා හඳුනාගැනීම, තොරතුරු සෙවීම, තොරතුරු ඇගයීම, මිලට ගැනීම

27 විකුණුම් ප්‍රවර්ධනය සඳහා ව්‍යාපාරික ආයතන අනුගමනය කරන ක්‍රමයක් වන්නේ,

(1) පුවත්පතක වෙළඳ දැන්වීමක් පලකිරීම මගින්

(2) මිල අඩුකර (සේල්) විකිණීමෙන්

(3) රූපවාහිනී දැන්වීමක් පලකිරීම මගින්

(4) ගුවන් විදුලියට දැන්වීමක් පලකිරීමට දීම මගින්

28 භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය යන නිෂ්පාදන සාධක සඳහා ගෙවීම් පිළිවෙලින් දැක්වෙනුයේ,

(1) බදුකුලී, වැටුප්, පොලී, ලාභ (2) ලාභ, වැටුප්, පොලී, බදුකුලී

(3) වැටුප්, පොලී, ලාභ, බදුකුලී (4) පොලී, වැටුප්, බදුකුලී, ලාභ

29 භාණ්ඩවල අයිතිය තමා සන්තකයේ රඳවානොගෙන තොග වෙළඳාමේ නිරතවන්නා හැඳින්වෙනුයේ,

(1) වණික් තොග වෙළෙන්දාය (2) නියෝජිත තොග වෙළෙන්දාය

(3) තොග වෙළෙන්දාය (4) සිල්ලර වෙළෙන්දාය

30 ප්‍රධානියා වෙනුවෙන් භාණ්ඩ ණයට විකිණීමේ දී අදාළ ණය මුදල් සම්බන්ධව වගකීම දරමින් කටයුතු කරන නිසා සාමාන්‍ය කොමිස් මුදලට අමතර කොමිස් මුදලක් හිමිවන නියෝජිතයා වනුයේ,

(1) කොමිස් නියෝජිතයා ය. (2) තැරැව්කරුය.

(3) කැපකරු නියෝජිතයා ය. (4) ප්‍රේරක නියෝජිතයා ය.

31 පුද්ගලයන් සමූහයක් මුදල් යොදවා තම ආර්ථික ශක්තිය උසස් කර ගැනීම සඳහා ස්වෙච්ඡාවෙන් ඇතිකරගන්නා ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) කේවල ස්වාමි ව්‍යාපාර (2) හවුල් ව්‍යාපාර

(3) සීමා සහිත සමාගම් (4) සමුපකාර සංවිධාන

32 එක් පුද්ගලයකුට වුවද ආරම්භ කළ හැකි වගකීම සීමා සහිත වූ ව්‍යාපාර සංවිධානය වනුයේ,

(1) කේවල ස්වාමි ව්‍යාපාරය (2) සීමිත පොදු සමාගමය

(3) හවුල් ව්‍යාපාරය (4) රාජ්‍ය සමාගමය

33 ව්‍යාපාරයක පැවතිය හැකි ජංගම නොවන වත්කම් පමණක් ඇතුළත් වනුයේ,

(1) ණයගැතියෝ, ලීබඩු, ඉඩම් සහ ගොඩනැගිලි, ඉතිරි භාණ්ඩ තොග

(2) ණයගැතියෝ, ලැබියයුතු ආදායම්, ඉතිරි භාණ්ඩ තොග, මුදල් ශේෂය

(3) ඉඩම් සහ ගොඩනැගිලි, රථවාහන, යන්ත්‍ර සහ උපකරණ, ලී බඩු

(4) ඉඩම් සහ ගොඩනැගිලි, ඉතිරි තොග, යන්ත්‍ර සහ උපකරණ, ලී බඩු

34 ව්‍යාපාරය සතු සම්පත් හා එම සම්පත් සපයන පාර්ශව වලට එකී සම්පත් සම්බන්ධයෙන් ව්‍යාපාරයේ ඇති බැඳීම පිළිබිඹු කෙරෙන ගණිතමය ඉදිරිපත් කිරීම හඳුන්වන්නේ,

(1) ගිණුම්කරණ සමීකරණය ලෙසය (2) ආදායම් ප්‍රකාශය ලෙසය

(3) ශේෂ පත්‍රය ලෙසය (4) ව්‍යාපාර සැලැස්ම ලෙසය

35 ආරම්භක ප්‍රාග්ධනය රු. 80000/- ක්ව පැවති ඉසුරුගේ ව්‍යාපාරයට රු. 35000 ණයක් ලබාගැනීමෙන් පසු ගිණුම්කරණ සමීකරණය වනුයේ,

| | හිමිකම් | + | වගකීම් | = | වත්කම් |
|---|---|---|---|---|---|
| (1) | 80000 | + | | = | 80000 |
| (2) | 80000 | + | 115000 | = | 80000 |
| (3) | 80000 | + | 35000 | = | 115000 |
| (4) | 115000 | + | 35000 | = | 150000 |

36 ව්‍යාපාරයක් නැවත විකිණීමේ පරමාර්ථයෙන් ණයට ලබාගන්නා භාණ්ඩ පිළිබඳ තොරතුරු සටහන් කෙරෙන මූලික පොත ගැනුම් පොතයි. ගැනුම් පොතෙන් ද්විත්ව ප්‍රතිඵලය ලෙජරයට පිටපත් වන්නේ,

(1) ගැණුම් ගිණුම හර මුදල් පොත බැර

(2) ගැණුම් ගිණුම හර විවිධ ණය හිමි ගිණුම බැර

(3) ගැණුම් ගිනුම හර විවිධ ණය ගැති ගිණුම බැර

(4) විවිධ ණයගැති ගිණුම හර මුදල් පොත බැර

37 මුදල් පොතක තොරතුරු සටහන් කිරීමට භාවිතා කරන මූලාශ්‍ර ලේඛනය වනුයේ,

(1) ලදුපත හා ඉන්වොයිසියයි. (2) වවුචරය හා විකුණුම් ඉන්වොයිසියයි.

(3) ලදුපත හා වවුචරයයි. (4) ලදුපත හා ගැණුම් ඉන්වොයිසියයි.

- 38, 39, 40 දක්වා වූ ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගන්න.
    - ව්‍යාපාරය ආරම්භක වත්කම් ලෙස රු. 75000/- ප්‍රාග්ධනය වශයෙන් යෙදෙව්වා.
    - රු. 40000/- බැංකු ණයක් ලබාගැනීම.
    - විකිණීම සඳහා බඩු තොගයක් ගත්තා රු. 8000/-
    - ව්‍යාපාරයට අවශ්‍ය ලී බඩු උපකරණ ගත්තා රු. 30000/-
    - අත්පිට භාණ්ඩ වික්කා රු. 18000/-
    - විකිණීම සඳහා බඩු තොගයක් අනිල්ගෙන් රු. 4000/- කට ණයට ගත්තා
    - බැංකු ණයෙන් රු. 10000/- ආපසු ගෙව්වා

38 ඉහත ගනුදෙනු අවසානයේ ප්‍රාග්ධනයේ සිදුවූ වෙනස්වීම් කෙසේද? එය ගිණුම්කරණ සමීකරණයේ දක්වන්නේ කෙසේ ද?

| | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|
| (1) | 115000 | = | 81000 | + | 34000 |
| (2) | 115000 | = | 75000 | + | 40000 |
| (3) | 111000 | = | 71000 | + | 40000 |
| (4) | 103000 | = | 63000 | + | 40000 |

39 මෙම ව්‍යාපාරයේ එම ගනුදෙනු සිදුවීමෙන් අනතුරුව ලාභයක් ලැබුවේ ද? එය කොපමණ ද?

(1) රු. 81000/- (2) රු. 6000/- (3) රු. 115000/- (4) රු. 18000/-

40 වගකීම්වල වැඩිවීම සහ අඩුවීම කොපමණ ද?

(1) වැඩිවීම 44000 අඩුවීම 10000 (2) වැඩිවීම 93000 අඩුවීම 12000

(ල. 40)

සියළුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

## මධ්‍ය වාර පරීක්ෂණය 2015

# ව්‍යවසායකත්ව අධ්‍යයනය - II

**11 ශ්‍රේණිය** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකය: |
|---|

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01 වෙරළබඩ ප්‍රදේශයට ආසන්නයේම ජීවත්වන අජිත් ''විදාතා ආයතනයෙන්'' ලබාගත් පුහුණුවකින් පසු මාළු ඇඹුල්තියල් නිපදවා ඇසුරුම් කර අලෙවිකිරීමේ ව්‍යාපාරයක් ඇරඹීය. ඒ සඳහා ප්‍රථමයෙන් මාළු ඇඹුල්තියල් අලෙවි කිරීමට යොදාගත් නගරයේ වෙළඳපොල ආශ්‍රිතව සමීක්ෂණයක් සිදුකරන ලදී. ඉන් පහත කරුණු හෙළිවුනි.

1. මෙම බල ප්‍රදේශයේ මුළු ජනගහනය 200000 කි.
2. මාළු ඇඹුල්තියල් පරිභෝජනයට ගන්නා සංඛ්‍යාව 7% කි.
3. ඔවුන්ගේ පරිභෝජන රටාව වන්නේ සතියකට ඇඹුල්තියල් මාළු පැකට් 2 බැගිනි.
4. දැනට සිටින සැපයුම්කරුවන් සමස්ත සැපයුමෙන් 35% ක් සපයයි. ව්‍යාපාරය සඳහා රු. 175000 මුදලක් අජිත් යෙදවූ අතර මහජන බැංකුවෙන් රු. 50000 ක ණය මුදලක් ද ලබාගන්නා ලදී.

මාළු ඇසුරුම් ප්‍රවාහනය සඳහා ත්‍රීරෝද රථයක් මිලට ගෙන නගරයට රැගෙන ගියේය. මේ සඳහා කම්කරුවන් තිදෙනෙකු වැටුපට යොදාගන්නා ලදී. නොබෝ දිනකින් සාර්ථක ව්‍යාපාරයක් කරගැනීමට අජිත්ට හැකි වී ඇත.

(1) අජිත්ගේ ව්‍යාපාරයේ ස්ථාපිත ව්‍යාපාර ක්‍රමය කුමක් ද? එහි දැකිය හැකි වාසි 2 ක් ලියන්න.

(2) අජිත්ගේ ව්‍යාපාරය එහි මෙහෙයුම් කටයුතු ඇරඹීමට පෙර ඉටුකළ කාර්යයන් හතරක් ලියන්න.

(3) බැංකු ණය ලබාගැනීමට පෙර අජිත් විසින් සම්පූර්ණ කළයුතු අවශ්‍යතා දෙකක් ලියන්න.

(4) බැංකු ජංගම ගිණුමක් අජිත් විසින් පවත්වාගෙන යන්නේ නම් අත්කර ගත හැකි ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න.

(5) ව්‍යාපාර සැලැස්මක් අජිත් විසින් පිළියෙල කළේ නම් ඉන් ලබාගත හැකි ප්‍රයෝජන හතරක් ලියන්න.

(6) මෙම ව්‍යාපාරයෙහි ආරම්භක තත්ත්වය ගිණුම්කරණ සමීකරණයෙහි ඇතුළත් කර දක්වන්න.

(7) මෙම සිද්ධියට අදාළව ප්‍රතිඵල අත්කර ගතහැකි පාර්ශව දෙකක් ලියන්න.

(8) මෙම නගරයේ මාළු ඇඹුල්තියල් ඉලක්ක පාරිභෝගික සංඛ්‍යාව කොපමණ ද?

(9) වෙළඳපොල සමීක්ෂණයට අනුව අදාළ ප්‍රදේශයේ මාළු ඇඹුල්තියල් සැපයුම සම්බන්ධයෙන් ඇති වෙළඳපොල හිඩැස කොපමණ ද?

(10) අජිත්ගේ ව්‍යාපාරයේ ආරම්භක ස්ථාවර ප්‍රාග්ධනය කොපමණ ද? (2 x 10 =

20)

02 අවට ප්‍රදේශය තුළ රැකියාවල නියුතු වූවන්, පාසල් සිසු සිසුවියන්, බාල මහළු යන කොයි කවුරුත් කොණ්ඩා කැපීම, මෝස්තර දැමීම, රූපාලංකාර කටයුතු යන කොයිදේ සඳහාත් පිය නඟන්නේ ''රේණු බියුටි සෙන්ටර්'' වෙතය. රූපාලංකාරය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා ඇති රේණුකා එහි අයිතිකාරිය වේ. ඉහත සේවාවන්ට අමතරව ක්‍රීම් වර්ග, රූපාලංකාර උපකරණ, ෂැම්පු වර්ග, හිස පළඳනා ආදිය මෙම ආයතනයෙන් මිලදී ගතහැකි වේ. රේණුකා ගනුදෙනුකරුවන්ගේ විවිධ සේවා ඉටුකිරීම සඳහා සේවිකාවන් හයදෙනෙක් පමණ සේවයේ යොදවා ඇති අතර පැමිණෙන සියලු දෙනාගේ අවශ්‍යතා පිළිබඳ විමසීමටත්, කාරුණිකව සැලකීමටත් ඔවුන් පුරුදු පුහුණු කර ඇත.

(1) රේණුකාගේ මිතුරියක වන මාලිකාද මෙම ව්‍යාපාරයට රු. 50000 ක් යොදා ව්‍යාපාරයෙහි පාර්ශවකරුවකු ලෙස එක්වීමට කැමැත්ත පළකොට ඇත. ඇය එක්වීමෙන් පසු ව්‍යාපාර සංවිධාන තත්ත්වය හඳුන්වන්නේ කෙසේද? ඒ සම්බන්ධයෙන් වැදගත් වන පනතක් පවතී ද? පවතීනම් එය නම් කරන්න.

(ල. 02)

(2) මෙම ව්‍යාපාරයේ අයිතිකරු වන රේණුකා එම ව්‍යාපාරයේ අයිතිකරු ලෙසත්, කළමනාකරු ලෙසත්, නායිකාව ලෙසත් කටයුතු කරන කාර්යයන් 1 බැගින් පෙන්වා දෙන්න. (ල. 03)

(3) මෙම ව්‍යාපාරය ඉතා තරගකාරී ව්‍යාපාර ක්ෂේත්‍රයකි. එම තරගකරුවන් අභිබවා යෑමට රේණුකාට අනුගමනය කළ හැකි කරුණු දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(4) මෙම ව්‍යාපාරය සාර්ථක වීමට තුඩුදුන් කරුණු 3 ක් සඳහන් කරන්න.(ල. 03)

03 සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවත්නා රටවලට කුඩා පරිමාණ ව්‍යාපාර එම රටවලට ඉටුකරන්නේ සුවිශාල මෙහෙයකි.

(1) කුඩා ව්‍යාපාර ලෙස සැලකීමට සමන්විත වන ලක්ෂණ හතරක් සඳහන් කරන්න.

(2) කුඩා ව්‍යාපාරවලින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුවේ. එසේ වැදගත් යැයි සැලකෙන කරුණු හතරක් සඳහන් කරන්න.

(3) ව්‍යාපාර යෝග්‍ය පරිදි ස්ථානගත කිරීමට සලකා බලන කරුණු හතරක් සඳහන් කරන්න.

(4) ව්‍යාපාරයක් ආරම්භයේ දී කරනු ලබන ශක්‍යතා අධ්‍යයනයෙන් අදහස් වන්නේ කුමක් ද? පැහැදිලි කරන්න.

(5) සම්පත් ඇගයීමේ දී මානව සම්පත අධ්‍යයනය කිරීමට යොදාගන්නා මනෝ විද්‍යාත්මක සාධක දෙකක් ලියන්න. (2 x 5 = 10)

04 (1) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකවලට අයත්වන්නේ මොනවාදැයි නම් කරන්න.

(2) ව්‍යාපාර අදහසක් යනු කුමක්ද? පැහැදිලි කරන්න.

(3) පාරිභෝගික හැසිරීම කෙරෙහි බලපාන පෞද්ගලික සාධක නම් කරන්න.

(4) වෙළඳපොළ සමීක්ෂණය යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(5) සීමා සහිත සමාගමක දැකිය හැකි ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (2 x 5 = 10)

05 (1) පහත සඳහන් පද පැහැදිලි කර උදාහරණය බැගින් ලියා දක්වන්න.

(a) ජංගම වත්කම් (b) ජංගම නොවන වත්කම්

(c) ජංගම වගකීම් (d) ජංගම නොවන වගකීම් (ල. 04)

(2) - අයිතිකරු රු. 75000/- ක ප්‍රාග්ධනයක් යොදා සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කළා

- විකිණීම සඳහා රු. 10000/- ක බඩු තොගයක් මිලට ගත්තා

- රු. 4000/- ක ලී බඩු මිලට ගත්තා

- රු. 50000/- බැංකු ණයක් ගත්තා

- සරත්ගෙන් විකිණීම සඳහා රු. 5000/- ක් වටිනා බඩු ගත්තා

- අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනය සඳහා රු. 1000/- ක මුදලක් ගත්තා

ගනුදෙනුවල බලපෑම දැක්වීමට පහත සඳහන් වගුව භාවිතයට ගන්න.(ල. 06)

| හිමිකම් | + වගකීම් | | = වත්කම් | | |
|---|---|---|---|---|---|
| ප්‍රාග්ධනය | + බැංකු ණය | + ණය හිමියෝ | = මුදල් | + බඩු තොග | + ලී බඩු |
| | | | | | |

06 (1) මූලාශ්‍ර ලේඛන යනු මොනවාදැයි පැහැදිලි කරන්න. (ල.02)

(2) මූලාශ්‍ර ලේඛන වලින් ලැබෙන ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 02)

(3) පහත සඳහන් වගුව පිටපත් කරගෙන සම්පූර්ණ කරන්න. (ල. 02)

| කාර්යය | මූලාශ්‍ර ලේඛනය | සටහන් කරන මූලික පොත |
|---|---|---|
| A වෙළඳ භාණ්ඩ ණයට ගැනීම | | |
| B වෙළඳ භාණ්ඩ ණයට විකුණුම් | | |
| C අත්පිට විකුණුම් | | |
| D විදුලි බිල් ගෙවීම | | |

(4) ජූඩ් බතික් ඇඳුම් මිලට ගෙන අලෙවි කරනු ලබන ව්‍යාපාරිකයෙකි. ජූඩ්ට ගිණුම්

The National e-learning Portal for The General Education

කටයුතු පිළිබඳ කිසිම අවබෝධයක් නොමැති අතර මුදල් ගනුදෙනු පිළිවෙලක් නොමැතිව සිහිවීමට පමණක් ලියා ඇත. ඒවා හර සටහන් හා බැර සටහන් වශයෙන් වෙන්කර දක්වන්න. ( ල . 04)

- ප්‍රාග්ධනය සඳහා මුදල් යෙදවීම රු. 50000/-
- බැංකු ණය ගැනීම රු. 25000/-
- අත්පිට විකුණුම් රු. 12000/-
- පෞද්ගලික ප්‍රයෝජනයට මුදල් ආපසු ගැනීම රු. 2000/-
- රක්ෂණ ගාස්තු ගෙවීම රු. 4000/-
- අත්පිට ගැනුම් රු. 8000/-
- ලී බඩු මිලට ගැනුම් රු. 7000/-
- ආයෝජන ආදායම් ලැබුනා රු. 3000/-

07 (1) ලසන්ත රෙදිපිළි මිලට ගෙන විකුණයි. 2014 ඔක්තෝබර් මාසයේ ගැනුම් පිළිබඳ තොරතුරු පහත දක්වේ. මෙම තොරතුරු ඇතුළත් කරමින් ලසන්තගේ ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය සකස් කරන්න. ( ල . 04)

| දිනය | ඉන්. අංකය. | සැපයුම්කරු | භාණ්ඩ පිළිබඳ විස්තර |
|---|---|---|---|
| 2014. 10. 05 | 280 | ප්‍රියන්ත | එකක් රු. 500/- ක් වූ කාන්තා ටී ෂර්ට් 20 |
| | | | එකක් රු. 800/- ක් වූ මසා නිම කළ කලිසම් 50 |
| | | | (අඩු කළ වෙළඳ වට්ටම 5%) |
| 2014. 10. 10 | 321 | සමන්ත | මීටරය රු. 100 බැගින් චීත්ත රෙදි මීටර 500 |
| | | | මීටරය රු. 150 බැගින් සුදු රෙදි මීටර 60 |
| | | | එකක් රු. 450/- බැගින් ඇඳ ඇතිරිලි 20 |
| | | | (අඩු කළ වෙළඳ වට්ටම 2%) |

(2) පහත සඳහන් තොරතුරු පදනම් කරගෙන 2015 ජනවාරි 31 දිනට ජානකී වෙළඳ සැලේ ශේෂ පත්‍රය පිළියෙල කරන්න. (ල. 06)

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධනය | රු. 250000 | ණයගැතියෝ | රු. 40000 |
| ශුද්ධ ලාභය | රු. 40000 | වෙළඳ ණය හිමියෝ | රු. 80000 |
| රථ වාහන | රු. 300000 | බැංකු ණය | රු. 175000 |

The National e-learning Portal for The General Education